**ශීර්ෂය 217 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට  වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත්  මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනා ගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මෙම වාර්තාවේ 1.6 ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණ අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වී නොතිබුණි.

(ආ) මෙම වාර්තාවේ 1.6.2 ඡේදයෙහි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු.64,605,215 ක් වූ අතර, එම ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ඒමේ දී රු.64,971,627 ක් ලෙස දක්වා තිබීම නිසා රු.366,412 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ආරම්භක ශේෂයට සිදු කරන ලද ගැලපීම් සටහන් මඟින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතුය. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) මැතිවරණ කොමිෂන් සභාවෙන් ප්‍රතිපූර්ණය කළයුතු අග්‍රිම ගිණුමේ රු.164,931ක් වූ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීමක් ලෙස හා ජංගම වත්කම් යටතේ මුදල් හා මුදල්වලට සමාන දෑ යටතේ දක්වා නොතිබුණි. | ජංගම වත්කම් හා වගකීම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | ප්‍රමාද දෝෂයකින් එම වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කිරීමට මඟ හැරී ඇත. නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. |

## 1.6.2 <u>ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | පවත්වා ගෙන යාමට කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) **හානි පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. | යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු සිදු කර ඇත. |
| (ඇ) **බැරකම් පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | 2020 වර්ෂයේ සිට පවත්වා ගෙන යාමට ආරම්භ කර ඇත. |

## 1.6.3 නීති, රීතී හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති, රීතී හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (අ) 3.7 වගන්තිය | ණය මුදල ආපසු අය කර ගැනීම ආරම්භ කල යුත්තේ ණය මුදල දෙනලද මාසය එක්කම ඊළඟ මාසයේ සිට වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධි විධානවලට අනුකූලව කටයුතු කල යුතුය. | 2020 ජනවාරි මස සිට සියලුම නිලධාරීන් සඳහා වැටුප් ගෙවීම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන බැවින් ඉදිරියේ දී මෙම වරද සිදු නොවනු ඇත. |
| (ආ) 3.8 වගන්තිය | ආපදා ණය වෙනුවෙන් සියයට 4.2 ක පොලී මුදලක් අයකර ගත යුතු වුවත්, නිලධාරීන් 16 දෙනෙකුගෙන් රු.79,077 ක පොළී මුදලක් එසේ අය කර ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යා යුතු වීම සහ අය නොකළ පොළිය අයකර ගතයුතු වීම. | 2020 සිට සියලුම නිලධාරීන් ගේ වැටුප් සැකසීම ප්‍රධාන කාර්යාලය මඟින් පමණක් සිදුවන බැවින් 2020 වර්ෂයේ සිට ඉදිරියට පොලී අඩුවෙන් අය වීමක් සිදු නොවනු ඇත. අඩුවෙන් අය වූ පොලී මුදල් අයකර ගැනීමට ඉදිරියේ දී කටයුතු යොදනු ඇත. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 2.1 දැක්ම හා මෙහෙවර

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ---------- | ----------------------------- |
| ජාතික ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමුන්ගේ ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ වෙනත් ළමයින්ගේ ද අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් ඔවුන්ට සමාන අවස්ථාවක් උදා කරදීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුවද, දෙපාර්තමේන්තුව ආරම්භ වූ 1956 වර්ෂයේ සිට මේ වනවිට වර්ෂ 62 ක් ගත වී තිබුණත්, ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඊට අදාල නීති සම්පාදනය කිරීම 2019 වර්ෂය වන විටත් සිදු කර නොතිබුණි. | මෙහෙවරට අනුකූලව ක්‍රියාකිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතුය. | විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සකස් කර ඇත. |

### 2.2 සැලසුම් කිරීම

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ---------- | -------------------------------- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අදාල වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර අන්තර්ගත වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතුයි. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු සලසා ඇත. |

## 2.3 ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්ය භාරයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ළමා නිවාස අධීක්ෂණය යන වැය විෂයය යටතේ ළමා නිවාස අධීක්ෂණය , ළමුන්ට රැකවරණය සපයන්නන් පුහුණු කිරීම, හඳුනාගත් ළමා නිවාසගත ළමුන් සමාජගත කිරීම යන කාර්යයන් 3 ක් ඉටු කිරීමට සැලසුම් කර රු.4,500,000 ක ප්‍රතිපාදන ඒ සඳහා සලසා ගෙන තිබුණි. මෙම අරමුණුවලට බැහැරව ළමා නිවාස පුනරුත්තාපනය හා ළමා පුහුණු උපදේශන මධ්‍යස්ථානයක මෙහෙයුම් වියදම් සඳහා රු.543,420 ක් වැය කර තිබුණි. එසේම ළමා නිවාස 7 ක් අධීක්ෂණය කිරීමට සැලසුම් කර තිබුණ ද ප්‍රගති වාර්තාව අනුව ළමා නිවාස 3 ක් අධීක්ෂණය කර ඇති බව සඳහන්ව තිබුණි. එසේ වුවද අධීක්ෂණය කල බව තහවුරු කිරීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. | පළාත් සභා යටතේ පවතින ළමා නිවාස අධීක්ෂණ කටයුතු සඳහා මෙම දෙපාර්තමේන්තු වට බලතල නොමැති අතර, ජාතික ළමාරක්ෂක අධිකාරිය ට ඒ සඳහා බලතල ඇත. එම අධීක්ෂණ වලදී හඳුනා ගන්නා ළමා නිවාස අවම තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා වන අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන්ට ප්‍රතිපාදන වෙන් නොවන නිසාත්, අප දෙපාර්තමේන්තුව මඟින් එම අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන ලබා දේ. ප්‍රමාණවත් ප්‍රතිපාදන ප්‍රමාණයක් මෙම විෂයයට වෙන් නොවීම හේතුවෙන් ආයතන තුනක අවශ්‍යතා ඉටු කිරීමට පමණක් සීමා වුණි. |
| (ආ) | ළමා නිවාස පුනරුත්ථාපනය යන වැය විෂයය යටතේ ප්‍රතිපාදිත මුදලින් රු.3,246,407 ක් ළමා නිවාස 10 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා පළාත් පරිවාස කොමසාරිස්වරුන් වෙත යවා තිබුණි. සැලසුම් කල පුනරුත්ථාපන කටයුතු නිම කිරීමට පෙර මුදල් යැවීම හේතුවෙන් එම මුදල් පොදු තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබීමත්, සැලසුම් පසුව වෙනස් කර වෙනත් කාර්යභාරයන් ඉටුකිරීමත්, මුදල් ඉතිරි වීම හා කාර්යභාරයන් නිසි පරිදි ඉටු කළ බවට පසුවිපරම් කර නොතිබීමත් ආදී කරුණු නිරීක්ෂණය විය. | නිසි තහවුරු කර ගැනීමකින් තොරව මුදල් වෙනත් පාර්ශවයන්ට ලබා නොදිය යුතුය. | පළාත් දෙපාර්තමේන්තු විසින් ඔවුන්ගේ පොදු තැන්පත් ගිණුම්වල රඳවා ගෙන අදාල කාර්යයන් නිම වූ පසු බාහිර පාර්ශවයන්ට ගෙවීම් සිදු කරනු ලබන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ළමා නිවාසගත දරුවන් 03 දෙනෙකු සමාජගත කිරීම සඳහා නිවාස ව්‍යාපෘතියක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පළාත් පරිවාස කොමසාරිස්වරුන් වෙත රු.300,000 ක් ලබා දී තිබුණි. එහෙත් ඉඩම් නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත්, මෙම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබූ එම මුදල් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි. පළාත් පරිවාස කොමසාරිස්වරුන්ගෙන් ඉල්ලීම සලකා බැලීමේ නිසි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම මේ සඳහා හේතු වී තිබුණි. | පළාත් කොමසාරිස්වරු න්ගේ ඉල්ලීම් සලකා බැලීමේ නිසි ක්‍රමවේදයක් අනුගමනය කල යුතුය. | අප දෙපාර්තමේන්තු අරමුණ වන්නේ නිවාසගතව සිටින ළමුන් හැකිතාක් සමාජගත කිරීමට සහාය ලබා දීම බැවින් එවැනි අවස්ථාවන්වලදී අදාල මුදල් ලබා දීම අනුමත කරනු ලැබේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව වෙත ළමා අපචාර හා අපයෝජන සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි 9,478 න් පැමිණිලි 2,649 ක් සඳහා තාවකාලික විසඳුම් පමණක් ලබා දී තිබීම හා පැමිණිලි 1,660 ක් වෙනත් ආයතනවලට හා පුද්ගලයන්ට යොමු කර තිබීම හේතුවෙන් පැමිණිලි සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව පසුවිපරම් කිරීම දුර්වල මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය විය. | පැමිණිලි සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදු කර ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | සෑම පැමිණිල්ලක් පිළිබඳවම පසුවිපරම් කිරීමට ප්‍රධාන කාර්යාලයට නොහැකි නිසා දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණයෙන් ඒ පිළිබඳ පසුවිපරම් කිරීම දිස්ත්‍රික් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/ සහකාරවරුන් විසින් සිදු කරයි. |
| (ඉ) | අවදානම් තත්ත්වයේ පසුවන දරුවන්ට ආරක්ෂාව සැපයීමේ අරමුණින් ආරක්ෂණ සැලසුම් 262 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.9,642,559 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 වෙත යවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුල රු.8,652,000 ක් වියදම් කර තිබුණි. ආරක්ෂණ සැලසුම් සඳහා ලද ඉල්ලීම් පිළිබඳව විස්තර පවත්වා ගෙන නොතිබීම හේතුවෙන් ආරක්ෂණ සැලසුම් සඳහා ලද ඉල්ලීම් ප්‍රමාණය හා තෝරා ගත් ක්‍රමවේදය තහවුරු කර ගැනීමට නොහැකි විය. | ආරක්ෂණ සැලසුම් සඳහා ලද ඉල්ලීම් පිළිබඳව විස්තර පවත්වා ගත යුතුය. | ආරක්ෂණ සැලසුම් සඳහා ලැබෙන ඉල්ලීම් පිළබඳ තොරතුරු සංක්ෂිප්තව සටහන් කර ගැනීමේ ක්‍රමවේදයක් මේ වන විට සකස් කරමින් පවතී. ආරක්ෂණ සැලසුම්වල තොරතුරු අනුව දරුවන් මුහුණ දී ඇති අවදානම් තත්ත්ව සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රතිලාභ සියලු පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ලැබෙන පරිදි ලබා දීමට උත්සහ ගනු ලබන අතර, විෂය නිලධාරීන් සහ සහකාර කොමසාරිස්වරුන් ඇතුළත් තිදෙනෙකුගෙන් තෝරනු ලබන සැලසුම් නිරීක්ෂණයට ලක් වේ. |